# සස ජාතකය

සද්ධර්මයන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සෙක්, සත් දිනක් බුදුපාමොක් මහ සඟනට සපිරිකර මහ දන් දුන් එක් කෙළෙඹිපුත්‍රයෙක් අරභයා මේ ජාතකය වදාළ සේක.

යටගිය දවස බරණැස බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක් රාජ්‍ය කරන කල්හි එක් වනයක වඳුරෙක්, සිවලෙක් මස්කාවෙක් සහ සාවෙක් ද ඉතා මිත්‍රව වාසය කළහ. සාවා ඉතා නුවණැති බැවින් ඔහුව සස පණ්ඩිත යන නමින් හැඳින්විය. මේ සස පණ්ඩිතයෝ දිනපතා ගොදුරු කෑමෙන් පසු එන තම මිතුරන් තිදෙනාට අවවාද කරන්නාහ. දිනක් මේ සිව් දෙනා සවස අහසෙහි පිරුන හඳ දැක හෙට පොහොය දවස හෙයින තෙපි සිල් ගනුව. සිල්වත් ව සිට දෙන දනෙහි විපාකය මහත්‍ය. එබැවින් කවරෙක් හෝ යාචකයෙක් තොප සමීපයට ආ නම් තොපි අනුභව කරන දෙයින යමක් දෙවයි අවවාද කළේ ය. පසු දින උදේ මස්කාවා ගොදුරු සොයා යන්නේ එක් බිලි වැද්දෙක් පසුව ගැනීමට වැලි යට දමා ගිය රේමසුන් සත් දෙනෙකුගෙන් යුත් වැලක් මස් ගඳින් ගොස් එය දැන අයිතිකරු සොයා බලා නොදැක එය ගෙන ගොස් වේලාව ආ කල කමියි සිතා පසෙක තබා තම සීලය සිහිපත් කරමින් උන්නාහ. සිවලා සිල් ඉටා ගොදුරු සොයා යන්නේ එක් පැළක වහලේ එල්ලූ වෙලූ තලගොයෙක් ද එක් දී ගෙඩියක් ද දැක තුන් යළක් අඬගා බලා අයිතිකරුවකු නොදැක එය ගෙන හිඳිනා තැනට අවුත් පසෙක තබා සිල් සිහි කරමින උන්නේය. වඳුරා ද ගොස් මී අඹ කැනක් ගෙනවුත් එල්ලා තබා තම ශීලය ආවර්ජනා කරමින සිටියේ ය. සාවා ද බඩගිනි ආ කල හී තණ කමි යි සිතා සිල් සිහි කරමින් වැදහෝත්තේ ය. නැවත සිතන්නේ මගෙන් යමෙක් අද කෑමට යමක් ඉල්ලූ නම් හී තණ දීමට ද නොහැක. උඳු, මුං, තල, මෑ ආදිය ද නැත. එබැවින් මම ඔහුට මගේ ඇඟ මස් දන් දෙමියි සිතුයේ ය.

ඔහ්ගේ සීල තේජසින් සක් දෙව් අසුන හුනුවූයේ ඊට හේතුව පරීක්ෂා කර බලා ඔවුන් සිව් දෙනාගේ සිල් ඉලමියි සිතා බමුණෙක් මෙන් මස්කාවා ළඟට ගොස් යමක් ඇයදී ය. ඔහු රේ මස් වැළ දන් දුන් පසු එය එහි ම තබා නැවත එන බව කියා ක්‍රමයෙන් හිවලා සමීපයට ද එතැනින් වඳුරා සමීපයට ද ගොස් පෙර සේම ලැබුණු දේ එහි ම තබා සාවා ළඟට ගොස් අහරක් ඇයදී ය. සස පණ්ඩිතයෝ ඉතා සතුටට පත් ව මාගේ ඉලා පොරොත්තුව මුදුන් පමුණුවා ගැනීමට ඔබගේ පැමිණීම ඉතා ම උතුම්ය. මම මීට පෙර නුදුන් විරූ දනක් අද තොපට දෙමි. බමුණ තොප ද සිල්වත් බැවින් සතුන් නොමරන්නෙහි ය. තොපි දර රැස් කොට ගිණි දල්වා අඟුරු බස්වා මට දන්වව. මම මගේ ජීවිතය තට පමුණුවාලා අඟුරට පැන පියමි. මාගේ ශරීරය හොඳින් පිළිස්සුනු කල්හි ඒ මස් අනුභව කොට හොඳින් සිල් රක්වයි දැන්වී ය. සක්‍රයා එබස් අසා තම ආනුභාවයෙන් අඟුරු රැසක් මවාලා සාවාට දැන්වී ය. සාවා සැතපී සිටිය තැනින් නැගිට තම ලොම් වැළවූ කිනිතුලන් ආදී කුඩා සතුන් තුන්විටක් ඇඟ කිලීපොළා අහකට යවා සියළු ශරීරය දාන මුඛයෙහි පැමිණේ එය අධිෂ්ඨාන කොට පියුම් ගැබකට පනින රාජ හංසයකු මෙන් සතුටු සිතින් අඟුරු මුදුනට පැන්නේ ය. ඒ ගින්නෙන් සස පණ්ඩිතයන්ගේ ලෝම කූපයකට පවා උණුසුමක් නොදැනුනේ ය. තම ශරීරය සිහිල් වූයේ ය. සස පණ්ඩිතයෝ එවිට ශක්‍රයා අමතා බ්‍රාහ්මණය මේ ගිනි ඉතා සිසිල් ය. ඒ කිමෙක් දැයි විචාලේ ය. එවිට සක්‍රයා සස පණ්ඩිතයෙනි මා බ්‍රාහ්මණයෙක් නොවෙමි. සක්‍රයා වෙමි. තොප ව පරීක්ෂා කිරීම සඳහා ආවෙමි යි කීහ. සක්‍රයෝ තොප තබා මෙලොව එක් වී ආවත් මා දන් දීමෙන් පරදවා ලිය නොහැක්ක. මා යමක් නොදෙතියි කවරෙක් කියත් දැයි විචාලේ ය. එවිට සක්‍රයා මා හු තිරිසනුන්ට පවා කළා වූ අරුමය මේ භද්‍ර කල්පය මුළුල්ලෙහි සියලු දෙනාට ප්‍රකාශව පෙනුනු සඳහා තම ආනුභාවයෙන් අංජන කූට පර්වතය මිරිකා රසය ගෙන චන්ද්‍ර මණ්ඩලයෙහි සස රූපය ඇඳ සස පණ්ඩිතයන් වඩා ගෙනවුත් ඒ වනයේ අලුත් හීතණ ඇතිරියක් පිට තබා ගියහ.

එසමයෙහි මස්කාවා නම් ආනන්ද ස්ථවිරයෝ ය. සිවලා නම් මුගලන් තෙරුන් ය. වඳුරා නම් සැරියුත් තෙරුන් ය. සස පණ්ඩිතයෝ නම් බුදුරජාණන් වහන්සේ ය.